# විකෘති නාට්‍ය



**නාට්‍ය නිෂ්පාදනය** සෝමලතා සුබසිංහ මහත්මිය




**නාට්‍යයේ තේමාව**

වැඩිහිටියන්ගේ අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීම සඳහා බාල පරපුර සතු සිතුම් පැතුම් හා අපේක්ෂාවන් බිලි දෙන ආකාරය පෙන්නුම් කරයි .

**නාට්‍ය දෘෂ්ටිය**

විවෘත ආර්ථිකය හේතුකොටගෙන 80 දශකයෙන් පසුව ලංකාවේ සමාජයත් පවුලත් අතර තිබෙන්නා වූ ඝට්ටනය ප්‍රේක්ෂක අවධානයට පාත්‍ර කිරීම සහ නූතන ලාංකික වැඩිහිටි පරපුරේ අපේක්ෂාවන් සහ බලාපොරොත්තු බවට පත්වී ඇත්තේ අසීමිත භෞතික සම්පත්වලින් පිරුණු විවිධ තාන්නමාන්න වලින් යුත් ජීවිත තම දරුවන්ට ලබා දීම බව නාට්‍යකරුවාගේ මූලික දෘෂ්ටියයි .

දැඩි ලෙස වාණිජකරණය වූ සමාජයක යහපත් පුරුෂාර්ථයන් විනාශ වී යන බව පෙන්වා දීම නාට්‍යකරුවාගේ දෘෂ්ටියයි

## <u>විකෘති  නාට්‍යයේ චරිත</u>

ප්‍රියංගනී _ ප්‍රධාන චරිතය

හිල්ඩා(මව) _ ප්‍රධාන චරිතය වටා ගෙතුණු සහාය චරිතය

(මෙම චරිත දෙක ප්‍රධාන චරිත වශයෙන් ප්‍රබලව නිරූපණය වේ)

කරුණාරත්න (පියා) ප්‍රශ්න ගැටළු දෙස මැදිහත් සිතින් බලන ආකාරය නිරූපනය වේ .

සම්පත් - ප්‍රියංගනීගේ සමීපතම යහළුවා

සුසිලා සම්පත් ගේ මව _/ ප්‍රියංගනී ගේ නැටුම් ගුරුවරිය

සරණපාල _ දුප්පත් පවුලක ඉපදී 5 ශිෂ්‍යත්වයෙන් සමත් ව කොළඹ රාජකීය විද්‍යාලයට පැමිණි අයෙක්

ජගත් _ පොහොසත් පවුලක දරුවෙක්

ප්‍රින්සි /ට්‍රින්සි/ ශ්‍රියා/ පියදාස _ හිල්ඩාගේ කන්තෝරුවෙ අය

සෙසු චරිත _ටියුෂන් මාස්ටර්, ශාස්ත්‍රකරු ගෝලයා, මද්දු , ස්වදේශ ,විදේශ .මඟුල් කපුවා, සෙසු මිතුරියෝ, වන්න ,චූටි, .

## විකෘති නාට්‍යයේ රංග ශෛලියේ ගොඩ නැගී ඇති ආකාරය

- අවස්ථා නිරූපණයෙන් රසක් යොදා ගැනීම.
- අවස්ථා නිරූපණයෙහි චරිත හා ක්‍රියානිරූපණය බොහෝ සෙයින් ලෝකධර්මී ස්වරූපයක් ගැනීම.
- නාට්‍ය ආරම්භයේ සහ ඇතැම් දර්ශන වලදී විවිධ ගීත සහ නර්තනමය කොටස් යොදා ගැනීම .
- බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ගේ රංග ශෛලියෙහි යම් යම් අංග ලක්ෂණ වල ආභාසය ලබමින් නාට්‍ය රංගනය යෙදා ගැනීම .
    - උදා:= වේදිකා පසුතල භාවිතය අවම වීම

. 

- සංකේත (පසුතල) යොදා ගැනීම .
- කෙටි දර්ශන ක්ෂණිකව වෙනස් වීම.

- අදහස් ප්‍රකාශනය සඳහා  ගීත හා නර්තන යොදාගැනීම.

➢ නාට්‍ය ප්‍රයෝග යොදා ගැනීම. උදාහරණ වශයෙන් බෝඩ් ලෑල්ලක් මගින් අවස්ථාව පිළිබඳ හඳුන්වා දීම

**පැවරුම**

1) විකෘති නාට්‍ය නිෂ්පාදනය කළ නාට්‍ය වේදනිය හඳුන්වන්න.

2) විකෘති නාට්‍යයේ තේමාව ලියන්න .

3) මෙහි ප්‍රධාන චරිතය වන ප්‍රියංගා තුළින් නාට්‍ය තේමාව ඉස්මතු වන ආකාරය උදාහරණ සහිතව ලියන්න.